(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 21.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2018 ජූලි 17 වැනි අඟහරුවාදා අ.භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

48/’18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 181ට අනුව, රත්‍රන් ආනයනය සඳහා බලපත්‍ර 50ක් නිකුත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එකී බලපත්‍රලාභීන්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් විසින් ගෙවූ බලපත්‍ර ගාස්තු පිළිබඳ විස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) වර්ෂ 1977 සිට මේ දක්වා ලෝක වෙළඳපොළෙහි රත්‍රන් මිල හැසිරීම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iv) බදු රහිතව ශ්‍රී ලංකාවට රත්‍රන් ආනයනය කරනු ලබන තැනැත්තන්ගේ නම් කවරේද;

(v) ශ්‍රී ලංකාව රත්‍රන් ආනයනය කරනු ලබන ප්‍රධාන සැපයුම්කරුවන් සහ රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

164/’18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා වෛද්‍ය උපාධිය හැදෑරීම සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) ඔවුන් ඇතුලත් වූ විදේශ වෛද්‍ය පීඨ සහ ඒවාට ඇතුලත් වූ ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(iii) එම විදේශ වෛද්‍ය අධ්‍යාපනය නිසා රටට අහිමි වූ විදේශ විනිමය ප්‍රමාණය;

එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

201/’18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014 වර්ෂයේදී බදුල්ල දිස්ත්‍රික්කයේ, මීරියබැද්ද නායයෑමෙන්,

(i) මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) විපතට පත් පුද්ගලයන්ට රජය විසින් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවන ලද උපරිම සහ අවම වන්දි මුදල කොපමණද;

(vi) අවතැන් වූ සියලුම දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(vii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

221/’18

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව, මාමඩු, අක්බෝවිල් ප්‍රදේශයේ පුරාණ සුසාන භූමියක් පිහිටා තිබෙන බවත්;

(ii) එම සුසාන භූමිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සලකුණු කර ඇති බවත්;

(iii) මෑතකදී එම ප්‍රදේශයේ තේක්ක ගස් කපා දැමීමේ සිද්ධියක් හේතුවෙන් එම සුසාන භූමියට සහ එහි පිහිටා තිබෙන පුරාවස්තුවලට හානි සිදුවී විනාශ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සුසාන භූමියෙහි පුරාවස්තු විනාශ කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද;

(ii) අනාගතයේදී එම පුරාවස්තු ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

246/’18

ගරු හේෂා විතානගේ මහතා,— උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

(iii) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, එම ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

396/’18

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) බන්ධනාගාර නියාමක තනතුරු සඳහා බඳවා ගැනීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ බව දන්නේද;

(ii) එසේ නම්, 2016.10.19 සිට 2016.10.27දක්වා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ සහ 2016.11.03 සිට 2016.11.12 දක්වා පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත අදාළ තනතුරු සඳහා තෝරාගන්නා ලද අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම තනතුරු සඳහා බඳවා ගැනීම් කර ඇති බව හා අදාළ ගිවිසුම් 2016.11.24 දින අත්සන් කරන ලෙස සුදුසුකම්ලාභීන්ට බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දී නැවත එය කල් දැමුවේ මන්ද;

(iv) එසේ කල් දැමූ පත්වීම් මේ වනවිටත් ලබා නොදීමට හේතුව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පත්වීම් ලබා දීමේ ගැටලු සහගත තත්ත්වයක් තිබියදී, පත්වීම්ලාභීන් අපහසුතාවයට පත්වන අයුරින් ඔවුන්ට ගිවිසුම් ලිපි ලබා දුන්නේ මන්ද;

(ii) සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ට පත්වීම් ලබා නොදීමෙන් ඔවුන් දැඩි අපහසුතාවයකට පත්ව සිටින බව පිළිගන්නේද;

(iii) එසේ නම්, පත්වීම් නැවත ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

418/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළමු එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදී ප්‍රහාරය සිදු කරන ලද දිනය කවරේද;

(ii) එම ප්‍රහාරය සිදු වූ ස්ථානය කවරේද;

(iii) එම ප්‍රහාරය එල්ල කරන ලද්දේ කා හටද;

(iv) එයින් අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් පළමුවෙන්ම සිවිල් වැසියන් ඉලක්කකර එල්ල කරන ලද ප්‍රහාරය කවරේද;

(ii) එම ප්‍රහාරය එල්ල කරන ලද දිනය කවරේද;

(iii) ප්‍රහාරය සිදු වූ ස්ථානය කවරේද;

(iv) එයින් අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් පළමුව ආගමික ස්ථානයකට එල්ල කළ ප්‍රහාරය කවරේද;

(ii) එම ප්‍රහාරය එල්ල කරන ලද දිනය කවරේද;

(iii) ප්‍රහාරය සිදු වූ ස්ථානය කවරේද;

(iv) එයින් විනාශ වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

428/’18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ජායා මහා විද්‍යාලය, “පාසල් දහසක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට” අයත් පාසලක් බවත්;

(ii) ව්‍යාපෘතියට අදාළ තාක්ෂණ ගොඩනැගිල්ල පමණක් දැනට ඉදිකර ඇති බවත්;

(iii) එම ව්‍යාපෘතියට අදාළ අනෙක් ගොඩනැගිලි මෙතෙක් ඉදිකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතියට අදාළ අනෙක් ගොඩනැගිලි ඉදි නොකිරීමට හේතුව කවරේද;

(ii) එම ගොඩනැගිලි ඉදිකර දීමට අවශ්‍ය කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

454/’18

ගරු බිමල් රත්නායක මහතා,— විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ “ගූගල් ලූන්” ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගූගල් සමාගම හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකර ගත් ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද;

(ii) මේ සඳහා ගූගල් සමාගම තෝරා ගැනීමට රජය තීරණය කළ පදනම කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය ලබාදීමට එකඟ වූ හා ලබාදුන් පහසුකම් කවරේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජයට වැය වූ මුදල කොපමණද;

(v) ගූගල් සමාගම ගුවන්ගත කළ බැලූනය කඩා වැටීමට බලපෑ හේතුව කවරේද;

(vi) ඒ පිළිබඳ පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් නිකුත් කර තිබේද;

(vii) ගූගල් සමාගම මෙම ව්‍යාපෘතිය අතහැර ඇති බවට ප්‍රකාශ කර තිබේද;

(viii) එසේ නම්, අදාළ ගිවිසුම හා එකඟතා කඩවීම හේතුවෙන් ඇති වූ මූල්‍යමය හා අනිකුත් හානි කවරේද;

(ix) එම හානිවල වගකීම පැවරෙන්නේ කාහටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

494/’18

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව යටතේ පාලනය වන ආයුර්වේද රෝහල් හා ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල නම් කවරේද;

(iii) දැනට එම රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වත්මන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව පළාතේ ආයුර්වේද රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල රැකියා ලබාදී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) එසේ රැකියා ලබාදුන් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් සහ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

520/'18

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ සුරාබදු ආදායම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) 2016 වර්ෂයේ දුම්කොළ හා සිගරට් නිෂ්පාදනය මත පනවන ලද බදු මඟින් උපයාගත් ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) පසුගිය වර්ෂයට සාපේක්ෂව, ඉහත (i) සහ (ii) හි ආදායම පිළිවෙලින් රුපියල් මිලියන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2016 වර්ෂයේ මෝල්ට් මධ්‍යසාර නිෂ්පාදනය ලීටර් කොපමණද;

(ii) 2016 වර්ෂය සඳහා මත්පැන් නිෂ්පාදනය අලුතින් ආරම්භ කිරීමට සමාගම්වලට නව බලපත්‍ර නිකුත් කර තිබේද;

(iii) එසේ නම්, එම බලපත්‍ර සංඛ්‍යාව සහ එම සමාගම්වල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සුරාබදු නීතිය යටතේ වැටලීම් සිදු කිරීමට බලය ඇති ආයතනය හා එහි අධිකාරි බලය ඇත්තේ කා හටද;

(ii) අත්අඩංගුවට පත් නීත්‍යානුකූල නොවන සුරා සම්බන්ධයෙන් නීති කටයුතු කිරීම සඳහා අධිකාරී බලය ඇත්තේ කා හටද;

(iii) ඔවුන්ගේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

530/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ සමස්ත බදුවලින් 57 %ක් අයකර ගනු ලබන්නේ ශ්‍රී ලංකා රේගුව විසින් බවත්;

(ii) ඉන් වැඩි බදු ප්‍රතිශතයක් වාහන ආනයන බදු බවත්;

(iii) බදු නොගෙවීමට වාහන ආනයනකරුවන් විවිධ උපක්‍රම භාවිතා කරන බවත්;

(iv) දැනට නිකුත් කර ඇති අති විශේෂ ගැසට් නිවේදනවලට අමතරව, 2015.02.10 දිනැති අංක 1901/3 ගැසට් නිවේදනය මඟින්ද, මෙම තත්ත්වය මඟ හැරවීමට නියෝග පනවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කෙසේ වෙතත්, 2015.09.22 දිනැති අංක 1933/6 ගැසට් නිවේදනයෙන් ජාවාරම්කරුවන්ට රිසි ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලබා දී ඇති බවත්;

(ii) අ (iv)හි සඳහන් ගැසට් නිවේදනයෙන් ලබා දුන් අධිකාරි බලය මත රේගු නිලධාරින් අනාවරණය කරගත් මිල අඩුවෙන් සඳහන් වාහන 1000 සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කළහොත්, රුපියල් මිලියන 8000කට අධික ආදායමක් අය කර ගත හැකි බවත්;

(iii) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝගය අනුව 2016.09.21 දින සියලු රේගු පරීක්ෂණයන් තාවකාලිකව අත්හිටුවීමෙන් රටට විශාල ආදායමක් අහිමි වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, ආ(iii)හි සඳහන් නියෝගය අවලංගු කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

593/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනාධිපති කාර්ය මණ්ඩලයේ හිටපු ප්‍රධානී ආචාර්ය අයි. එච්. කේ. මහානාම සහ රාජ්‍ය දැව සංස්ථාවේ හිටපු සභාපති පී. දිසානායක යන මහත්වරුන් ඔවුන්ගේ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන සේවයේ ආරම්භයේ සිට මේ දක්වා,

(i) දරා ඇති තනතුරු;

(ii) එකී තනතුරු දරන ලද කාලවකවානු;

(iii) එම තනතුරු දරමින් සේවය කර ඇති ආයතන;

(iv) එකී සේවා කාලවලදී ඔවුන්ට එරෙහිව විනය හෝ වෙනයම් චෝදනා ඉදිරිපත්ව තිබුණේ නම්, එම චෝදනා සහ ඒවාට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආචාර්ය අයි. එච්. කේ. මහානාම මහතාට ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි තනතුරට පත්වීමටත්, පී. දිසානායක මහතාට රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති තනතුර ලබා ගැනීමටත් නිර්දේශ ලබා දී ඇත්තේ කවුරුන්ද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

961/'18

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුරුවරුන් නව දැනුමෙන් පෝෂණය කිරීමට ගුරු පුහුණු වැඩසටහන් ඉවහල් වන බව පිළිගන්නේද;

(ii) 2015, 2016 සහ 2017 වර්ෂවලදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කලාප හා විෂය මට්ටමින් ගුරු පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබුවේද;

(iii) එසේ සංවිධානය කළ ගුරු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව, විෂයයන් හා ඊට වැය වූ මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2016.06.06 දිනට බස්නාහිර පළාතේ, මීනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් පාසල අනුව කොපමණද;

(ii) 2015, 2016 සහ 2017 වර්ෂවලදී ඔවුන් පුහුණු කිරීමට පවත්වා ඇති වැඩසටහන් සංඛ්‍යාව සහ ඊට වැය වූ මුදල, එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ සඳහා වෙන්කළ මුදල හා ක්‍රියාත්මක කළ ගුරු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

(iv) ගුරු පුහුණු වැඩසටහන්වලට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ විමධ්‍යගත අරමුදලින් ප්‍රතිපාදන වෙන් කිරීමට නොහැකි බව දන්නේද;

(v) ජාතික අවශ්‍යතාවයක් සේ සලකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ විමධ්‍යගත අරමුදලින් ගුරු පුහුණු වැඩසටහන්වලට ප්‍රතිපාදන වෙන් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

962/'18

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 අයවැයෙන් නාවික ක්ෂේත්‍රය, විදේශීය සමාගම්වලට 100%ක් විවෘත කිරීමට කළ යෝජනාවට එකඟ වන්නේද;

(ii) ලංකා නැව් ඒජන්තවරුන්ගේ සංගමය (CASA) විසින් රජයේ වගකිවයුතු නිලධාරින්ට ලිපියකින් දන්වා ඇති පරිදි, මෙම විවෘත කිරීම නැවැත්වීමට කටයුතු කරන්නේද;

(iii) නැව් සමාගම් ඒකාධිකාරී වීම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— හානිපූරණය සඳහා වන කාර්යාලය,— හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම පිණිස ද; හානිපූරණය සඳහා යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන් හඳුනා ගැනීම සඳහා සහ එම තැනැත්තන්ට තනි සහ සාමූහික හානිපූරණයන් ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද; 1987 අංක 29 දරන තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත ඉවත් කිරීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

2.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු (සංශෝධන),— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

3.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— වෛද්‍ය (සංශෝධන),— (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 112හි විධිවිධානවල සහ 2018 ජුනි මස 20 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණද, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, මන්ත්‍රීවරයන් නව දෙනෙකුගෙන් (09) සමන්විත විය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත — කාරක සභාව.

*4.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59 සහ 63 වගන්ති සමඟ කියවිය යුතු, 142(2) වගන්තියේ (ද) ඡේදය යටතේ 2017 අංක 2 දරන ඖෂධ ලියාපදිංචි කිරීම (ගාස්තු) නියෝග සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 05 දිනැති අංක 2052/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.04.03 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.22 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 04/2018 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1004 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථා,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ 7 වැනි වගන්තිය යටතේ තැපැල් ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව තැපැල් තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජුනි 07 දිනැති අංක 2074/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.20 දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථා අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයන් වෙත දැනට ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා 2018.06.01 දින සිට පහත සඳහන් පරිදි සංශෝධනය කර ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා දැනට ගෙවනු ලබන රු. 100,000/- ක මාසික දීමනාව රු.135,000/- දක්වා වැඩි කිරීම හා මෙම දීමනාවට අමතරව දැනට ගෙවනු ලබන අනෙකුත් සියලු දීමනා සංශෝධනය කිරීමකින් තොරව ඒ අයුරින්ම ගෙවීමටද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන් හි සභාපතිවරයකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක් ගෙවීමටද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයන් සඳහා දැනට ගෙවනු ලබන රු. 75,000/-ක මාසික දීමනාව රු. 90,000/- දක්වා වැඩි කිරීම හා මෙයට අමතරව දැනට ගෙවනු ලබන අනෙකුත් දීමනා ඒ අයුරින් ම තවදුරටත් ගෙවීමටද;

(ඈ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයන් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගි වීම වෙනුවෙන් රු.10,000/- ක දීමනාව එලෙසම ගෙවීමටද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 8 වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා සමානව සාමාජිකයන්ට ද බලතල පවරා ඇති බැවින්, එම සාමාජිකයන්ට දැනට ගෙවනු ලබන රු. 95,000/-ක මාසික දීමනාව රු. 130,000/- දක්වා වැඩි කිරීම හා දැනට ගෙවනු ලබන අනෙකුත් දීමනා තවදුරටත් ඒ අයුරින් ම ගෙවීමට; සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයන් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාල සීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් ¾ක විශේෂ දීමනාවක් ගෙවීමටද

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයන්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

*11.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

සුරැකුම්පත් විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අල්ලස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව,— 2017 අංක 17 දරන පනතින් සංශෝධිත 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 3අ. (11) වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කමිටුව විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදුව 2018.03.06 දින පාර්ලිමේන්තුවේදී සභාගත කරන ලද එකී කමිටුවේ වාර්තාව අනුමත කළ යුතු ය.

*21.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලද, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු, මාධ්‍ය උපමාන අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව 2015.11.27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපතිවරයා වශයෙන් පත්කර ඇති හෙයින්ද;

විගණකාධිපතිවරයාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2017.11.14 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතාට පහත පරිදි වැටුප් හා දීමනා ගෙවීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) 2015.11.27 වැනි දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව SL - 4 වැටුප් පරිමාණයේ 08 වැනි වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හා තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමට;

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව 2016.01.01 වැනි දින සිට වැටුප පරිවර්තනය කිරීමේ දී SL – 4 වැටුප් ක්‍රමය යටතේ එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය කර ගෙවීමට; සහ

(ඇ) එකී වැටුප් පරිමාණයට අදාළ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*23.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2016),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.16 වැනි දින ඉදිරිපත් කරන ලද 2016.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*24.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.24 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*25.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2016),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.12.04 වැනි දින ඉදිරිපත් කරන ලද 2016.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*26.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.11.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*27.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2017.06.23 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.09.21 දින සලකා බලන ලදී.)

*28.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2017.11.11 වැනි දින ඉදිරිපත් කරන ලද 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.06 දින සලකා බලන ලදී.)

*29.

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.08.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ස්වාධීන විගණකවරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.09.21 දින සලකා බලන ලදී.)

*30.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2012),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වැනි වගන්තිය යටතේ 2017.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.11.10 දින සලකා බලන ලදී.)

*31.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වැනි වගන්තිය යටතේ 2017.12.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.20 දින සලකා බලන ලදී.)

*32.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිසම පනතේ 31 වැනි වගන්තිය යටතේ 2017.12.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.03.20 දින සලකා බලන ලදී.)

*33.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වැනි වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ වගන්ති II ට අනුව 2017.10.20 වැනි දින ඉදිරිපත් කරන ලද 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.02.20 දින සලකා බලන ලදී.)

*34.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2016),— 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 37(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය අනුව, 2017.12.07 වන දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.02.20 දින සලකා බලන ලදී.)

*35.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2014),— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ, 2016.08.12 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*36.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2013),— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව යටතේ, 2016.06.09 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*37.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව (2013),— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව යටතේ, 2016.07.05 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*38.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2014),— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව යටතේ, 2017.03.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*39.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2014),— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ, 2017.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014. 12. 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*40.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2013),— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ, 2016.01.29 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013. 12. 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*41.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව (2014),— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව යටතේ, 2016.12.02 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014. 12. 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*42.

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2015),— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ, 2017.06.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.11 දින සලකා බලන ලදී.)

*43.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2017.10.17 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*44.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2017.10.17 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*45.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2017.10.17 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*46.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2017.03.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*47.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2017.08.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*48.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2016.10.26 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*49.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2017.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*50.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2015),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2018.02.21 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2018.05.23 දින සලකා බලන ලදී.)

*51.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වැනි වගන්තිය යටතේ 2016.07.20 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*52.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වැනි වගන්තිය යටතේ 2017.02.22 ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*53.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2012),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වැනි වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස යටතේ, 2015.11.21 දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.11.20 දින සලකා බලන ලදී.)

*54.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වැනි වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස යටතේ 2017.01.24 දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.11.20 දින සලකා බලන ලදී.)

*55.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වැනි වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස යටතේ, 2017.02.22 දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.11.20 දින සලකා බලන ලදී.)

*56.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැළණිය විශ්වවිද්‍යාලයහි වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත්, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැළණිය විශ්වවිද්‍යාලයහි වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*57.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2017.08.11 දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*58.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කළමණාකරන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2017.03.23 දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කළමණාකරන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*59.

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— කළමණාකරන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ xiii වැනි පරිච්ඡේදයේ 110 වැනි වගන්තිය යටතේ 2017.03.23 දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කළමණාකරන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.12.08 දින සලකා බලන ලදී.)

*60.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

61.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

62.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

63.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

64.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

65.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

66.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

67.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

68.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

69.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

70.

ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්යය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*